Department of Education Sabaragamuwa Province/ Weekly School

**පාඩම : විකසනය**

1. සවිධි ෂඩස්‍රාකාර ප්‍රිස්මයක විකසනය ඇඳීම


පාදයක දිග 20mm වන සවිධි ෂඩස්‍රාකාර ප්‍රිස්මයේ විකසනය අඳිමු. ( උස 40mm වේ).

I. තිරස් රේඛාවක් ඇඳ ප්‍රිස්මයේ පැත්තක දිග වන 30mm වූ කොටස් 06ක් ලකුණු කරන්න.

II. ලකුණු කළ ස්ථාන වලින් ලම්භක රේඛා ඇඳ ඒවා මත ප්‍රිස්මයේ උස වන 40mm බැගින් ලකුණු කරන්න.

III. ලකුණු කළ ස්ථාන යා කරන්න.

IV. සුදුසු ස්ථානයකින් පියන සහ පතුළ අදින්න. එනම් 10 ශ්‍රේණියේදී ඔබ උගත් ආකාරයට පාදයක් 20mm වන ෂඩස්‍ර 02ක් අදින්න.



2. <u>සවිධි පංචාස්‍රාකාර ප්‍රිස්මයක විකසනය ඇඳීම</u>

පාදයක දිග 30mm ක් හා උස 30mm  වන සවිධි පංචාස්‍රාකාර ප්‍රිස්මයේ විකසනය අඳිමු.

I. තිරස් රේඛාවක් ඇඳ පංචාස්‍රයේ පාදයක දිග වන 30mm වූ කොටස් 05ක් ලකුණු කරන්න.

II. ලකුණු කළ ස්ථාන වලින් ලම්භක රේඛා ඇඳ ඒවා මත ප්‍රිස්මයේ උස වන 30mm බැගින් ලකුණු කරන්න.

III. සුදුසු ස්ථානයකින් පියන සහ පතුළ අඳින්න. එනම් 10 ශ්‍රේණියේදී ඔබ උගත් ආකාරයට පාදයක් 30mm වන සවිධි පංචාස්‍ර 02ක් අඳින්න.

